VERITÉ RESEARCH

NO. 5 POLICE PARK PLACE, COLOMBO 00500, SRI LANKA
TEL: + 94 718 834945; FAX: +94 719379567
EMAIL: RECEPTION@VERITERESEARCH.ORG


# වෙළඳ හිඟය අඩු කිරීම : රාජ්‍ය ප්‍රතිපත්තියෙහි මගහැරුනු ඉසව්වන්

ශ්‍රීලංකාව ඉහළ වෙළඳ හිඟයකින් පීඩා විඳින ආර්ථිකයකි. පසුගිය වසර කිහිපය තුළ වෙළෙඳ හිඟය සීඝ්‍ර ලෙස ඉහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කරනලදි. වර්තමානයේදී රජය විසින් මේ සඳහා විසඳුමක් ලෙස ආදේශන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ ද වෙළඳ හිඟයේ තීව්‍රතාවය පිළිබඳ ගැටළුව විසඳීමට එය අපොහොසත් වී ඇත.

ආර්ථිකයක වෙළඳ ගිණුමේ හිඟයක් ඇතිවීමට බලපාන ප්‍රධාන සාධකය එම ආර්ථිකය විදේශ වෙළඳාම තුළ නියුතු වීමේදී භාණ්ඩ විකිණීමට වඩා මිලදී ගැනීමයි. උදාහරණයක් ලෙස යම්කිසි ගෘහයක් තමන්ගේ ආදායම ඉක්මවා විදයම් කරයි නම්, එම හිඟය පියවාගැනීම සඳහා ණයක් ගැනීමට සිදුවේ. මේ ක්‍රියාවලිය දිගින් දිගටම ක්‍රියාත්මක වුවහොත් ණයබරතාවය සීඝ්‍රයෙන් ඉහළ යන අතර ණයහිමියන් ණය ආපසු ගෙවන ලෙසට බලපෑම් එල්ල කිරීමට පටන් ගනියි. ණය ආපසු ගෙවීමේ හැකියාවක් නොමැති වූ විට ගෙදර තිබෙන බඩුබාහිරාදිය විකිණීමට පවා සිදුවේ. තම ආදායම ඉක්මවා වියදම් කරන වාතාවරණයක් තුළ රටකට සිදුවන්නේ ද මීට සමාන ඉරණමකට මුහුණ දීමටය.

වර්තමානයේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය රුපියල් අගයෙන් පමණක් නොව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසද ඉතා සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇත. (රූප සටහන 01) 2011 දී ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 16.4% ක් වැනි ඉහළ අගයක් ගත් අතර එය පසුගිය දශකය තුළ වාර්තා වූ ඉහළම අගයයි. රජය විසින් මෙම ඉහළ වෙළඳ හිඟය අඩු කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනුලැබුවද එමගින් වෙළඳ හිඟය අඩු කිරීම සඳහා ලැබුනේ සුළු දායකත්වයකි. එමනිසා 2012 අවසාන වන විටද වෙළඳ හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් 15.8% ක් වැනි ඉහළ අගයක් ගන්නා ලදි. ඉතා ඉහළ වෙළඳ හිඟයක් පැවතීම ආර්ථිකයකට බලවත් ගැටළුවකි. එය විසඳීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සාර්ථක වී නොමැති අතර, ක්‍රියාත්මක කළ යුතු සැබෑ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කොට නොමැත.

**රූප සටහන 01: වෙළඳ හිගය (දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස %)**




**ආනයන ආදේශන ප්‍රතිපත්තිය**

පසුගිය අවුරුදු කිහිපය තුළ රජය විසින් ඉදිරිපත් කරන ලද අයවැය කථන සහ ප්‍රතිපත්ති දෙස බැලීමේදී පෙනීයන ප්‍රධාන කරුණක් වන්නේ වෙළඳ හිගය අඩුකිරීම සඳහා වන ප්‍රතිපත්තිය ආනයන අධෛර්ය කිරීම සහ ආනයන සඳහා දේශීය ආදේශන ඉදිරිමත් කිරීම යන කරුණු මත ක්‍රියාත්මක වන බවයි. ආර්ථික විද්‍යාව තුළ මෙය ආනයන ආදේශනය ලෙස හඳුන්වනු ලබයි.

ආනයන ආදේශනය සඳහා රජය විසින් තෝරාගෙන ඇති ප්‍රධාන ක්ෂෙත්‍රයන් අතර ආහාර ක්ෂෙත්‍රයට විශේෂ තැනක් හිමිවේ. 2013 අයවැය කථාවේදී මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමුකරමින් ජනාධිපතිතුමා මෙසේ පැවසීය."........ කිරි හා පශු සම්පත් කර්මාන්තය අපේ රටේ සීඝ්‍රයෙන් දියුණු කළ හැකි සුවිශේෂී ආර්ථික කටයුත්තකි. මෙම කර්මාන්තය දියුණු කිරීමෙන් වසරකට මිලියන 350 ක පමණ විදේශ විනියමය ඉතිරි කර ගත හැකිය...." එමෙන්ම "විශේෂ භාණ්ඩ බදු පැනවීම මගින් සහල්, බඩ ඉරිඟු, ලූනු , අල හා දියර කිරි නිෂ්පාදනය වැඩි කිරීමට ගොවියන් දිරිගැන්වීමටත් ආනයන අඩු කර ගැනීමටත් හැකි වුණා"

**ආනයන ආදේශන ප්‍රතිපත්තියෙහි අඩුලුහුඩුකම්**

දේශීය ආහාර හා භෝග ප්‍රවර්ධනය සහ ආනයනික ආහාර මත රඳා පැවැත්ම අඩු කිරීම තුළින් ආහාර සුරක්ෂිතතාවය සහ දේශීය ගොවියන් නඟා සිටුවීමට විශාල පිටුවහලක් සැපයිය හැක. එනමුදු වෙළඳ හිගය අඩු කිරීම යන විශාල අභියෝගය හා සම්බන්ධව බැලූ විට එය වැරදි නිගමනයකි. මෙයට හේතුව වන්නේ ආහාර ශ්‍රී ලංකාවේ ආනයන සංයුතියෙන් 7% ක් (2012 දත්ත) වැනි කුඩා අගයක් ගන්නා අංශයක් වීමයි (රූප සටහන 02). එමෙන්ම ආනයන සංයුතිය තුළ ආහාර යන අංශයේ වැදගත්කම 2002 - 2011 කාලය තුළ අඩුවීමේ ප්‍රවණතාවයක් පෙන්නුම් කොට ඇත. මේ අනුව බලන විට ආහාර යන

ක්ෂේත්‍රය ප්‍රමුඛව සිදුකරන ආනයන ආදේශනය තුළින් වෙළඳ හිඟය අඩු කරගැනීම සඳහා සැලකිය යුතු දායකත්වයක් ලැබෙන බවක් දක්නට නොලැබේ.

පසුගිය දශකය තුළ ආනයන වල වර්ධනය සඳහා ඉහළම දායකත්වය සපයන ලද්දේ පෙට්‍රෝලියම් ආනයනයයි. 2000 දී පෙට්‍රෝලියම්, ආනයන සංයුතිය තුළ 12% ක් වැනි අගයක් ගත් අතර 2012 වන විට එය 26% ක වැනි ඉහළ අගයකට පත්කරන ලදී. එමෙන්ම 2002-2011 දක්වා කාලය තුළ ආනයනවල සාමාන්‍ය වර්ධන වේගය සඳහා පෙට්‍රෝලියම් විසින් ඉහළම දායකත්වය ලබාදෙන ලද අතර එය 29% ක් වැනි ඉහළ අගයක් ගන්නා ලදී.

පෙට්‍රෝලියම් බිල අඩු කිරීම සඳහා ඉන්ධන වඩා කාර්යක්ෂම ලෙස භාවිතා කෙරෙන බලශක්ති සහ ප්‍රවාහන පද්ධතියන් පැවතීම අනිවාර්ය සාධක වේ. ශ්‍රී ලංකා සන්දර්භය තුළ තවමත් මෙම ක්ෂේත්‍රයන් දෙකෙහි ප්‍රගමනය පවතින්නේ මූලික අදියරයකය. උදාහරණයක් ලෙස හයිබ්‍රිඩ් (දෙමුහුන්) වර්ගයේ වාහන ශ්‍රී ලංකාවට ආනයනය කළ මුල් වකවානුවේදී ඒ සඳහා විශාල බදු සහන ලබාදුන්නද එම සහන පසුගිය වසරේදී ඉවත් කරන ලදී.

එමෙන්ම ශ්‍රී ලංකාවේ ප්‍රධාන දුම්රියපොළ ලෙස ක්‍රියාත්මක වන කොළඹ කොටුව දුම්රියපොළ නඩත්තුව ඉතා දුර්වල මට්ටමක පවතින අතර 1917 දී එය ආරම්භ කළ දා පටන් මේ වනතුරු සැලකිය යුතු මට්ටමේ සංවර්ධනයක් එහි සිදුවී නොමැත. මෑතකදී "වෙරිටේ රිසර්ච්" මගින් සිදුකරන ලද සම්මුඛ සාකච්ඡාවලදී හෙළිවූයේ වඩාත් දුගී මට්ටමේ පසුවන ජනතාව බස් ප්‍රවාහනය සම්බන්ධව අප්‍රසාදයකින් පසුවන බවය. දුම්රිය ප්‍රමුඛ පොදු ප්‍රවාහන පද්ධතියේ බිඳ වැටීම නිසා පෞද්ගලික වාහන සඳහා ඇති ඉල්ලුම ඉතා සීඝ්‍ර ලෙස ඉහළ ගොස් ඇති අතර, ඊට සාපේක්ෂව ඉන්ධන සඳහා ඇති ඉල්ලුමද විශාල ලෙස වර්ධනය වී ඇත.

## වැරදුනු ප්‍රතිපත්තිමය දිශානතිය

සත්‍ය වශයෙන් බැලීමේදී ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සම්පූර්ණ ආනයන ආදේශන ප්‍රතිපත්තියම නැවතත් විමසා බැලිය යුතුය. ශ්‍රී ලංකාවට ඉහළ ආර්ථික වර්ධන වේගයක් ළඟාකරගැනීම ඉතා වැදගත් වන අතර මෙහිදී මුහුණදීමට සිදුවන ප්‍රධාන ගැටළුවන් වන්නේ භාණ්ඩ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන සැපයුම් මූලාශ්‍ර (විශේෂයෙන් අන්තර් භාණ්ඩ) ඉතා විශාල ලෙස ආනයන මත රඳා පැවතීමයි. අපනයන කර්මාන්ත මත පදනම් වූ විශාල භාණ්ඩ නිෂ්පාදන පරිමාවකින් තොරව සැපයුම් මූලාශ්‍ර මත විශාල ආයෝජනයන් සිදුකිරීම එතරම් යථාර්ථවාදී නොවේ.


මෙය නව සොයා ගැනීමක් නොවේ. මහාචාර්ය ඩබ්ලිව්.ලක්ෂමන් මහතා විසින් සංස්කරණය කරන ලද ආර්ථික විද්‍යා ලිපියක් වන "Dillemmas of Development (1997)" (සංවර්ධනයෙහි උභතෝකෝටියන්) හි ආනයන ආදේශනය පිළිබඳව මෙසේ දක්වා ඇත. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වූ ආනයන ආදේශන ප්‍රතිපත්ති විසින් විදේශ විනිමය රට තුළ ඉතිරි කර ගැනීමට දායකත්වයක් ලබාදී නොමැත. ආනයන ආදේශන ප්‍රතිපත්තිය මගින් සිදුවූ මූලික වෙනස නම් ආනයන වල සංයුතිය අවසන්

භාණ්ඩ වල සිට අන්තර් භාණ්ඩ (භාණ්ඩ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදාගන්නා අතර මැදි භාණ්ඩ) වෙතට වෙනස් වීමයි. ආනයන ආදේශන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන ලද බොහෝ දියුණුවෙමින් පවතින රටවලට මෙම අත්දැකීමට මුහුණදීමට සිදුවී ඇත. නැගෙනහිර ආසියාතික කලාපයේ ඇතැම් රටවලට සාර්ථක ආනයන ආදේශන ප්‍රත්පත්තීන් ක්‍රියාත්මක කිරීමට හැකියාවක් ලැබුණු අතර එම සාර්ථකත්වයට බලපෑ ප්‍රධාන කරුණ නම් ආනයන ආදේශන කර්මාන්ත ක්‍රමයෙන් අපනයන කර්මාන්ත බවට පත්වීමයි.

වර්තමානයටද මෙම කරුණ ඒ ආකාරයෙන් බලපානු ලැබේ (රූප සටහන 02). ශ්‍රී ලංකාවේ ආනයන වර්ධනය සඳහා දෙවෙනියට ප්‍රමුඛ අංශය වන්නේ අන්තර් භාණ්ඩයි.ආහාර භෝග සඳහා යොදාගන්නා පොහොර මෙම අන්තර් භාණ්ඩ ගණයට ඇතුලත් වේ. එමෙන්ම ''යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ'' සහ ''අනෙකුත් පාරිභෝගික භාණ්ඩ'' සමව තුන්වන ස්ථානයේ පසුවේ. 8% ක ආනයන වර්ධන දායකත්වයක් ලබා දී ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය මෙහි හතර වැනි ස්ථානයේ පසුවේ.

මින් පැහැදිලි වන යථාර්ථය නම් වෙළඳ හිඟය අඩුකිරීම සඳහා දේශීය භෝග නැංවීම සහ ආනයන ආදේශනය සාර්ථක විසඳුමක් නොවන බවය. මේ සඳහා ක්‍රියාත්මක කළ යුතු ආර්ථික ප්‍රතිපත්තිය අපනයන ධෛර්යමත් කිරීම සහ සැපයුම් අංශයේ යටිතල පහසුකම් නැංවීම මත පදනම් විය යුතුය. එසේ නොමැතිව කෙටි කාලීන විසඳුම් ලෙස ආනයන මත බදු ඉහළ දැමීම වැනි ක්‍රියාමාර්ග තුළින් වෙළඳ හිඟය ප්‍රසාරණය තුළින් ඇතිවූ පීඩනය එකවර පුපුරා ගොස් ආර්ථික වර්ධනයටද ඉතා අහිතකර බලපෑම් එල්ල විය හැක.

රූප සටහන 02: ආනයන වල සාමාන්‍ය වර්ධනය සඳහා දායකත්වය (2002-2011)




වෙරිටේ රිසර්ච් **(Verite Research)** යනු රාජ්‍ය අංශයට උපාය මාර්ගික හා ප්‍රතිපත්ති සම්පාදනය සඳහා උපදෙස් ලබා දෙන සහ පෞද්ගලික අංශයට ආර්ථික විද්‍යාත්මක, නීතිමය, මාධ්‍ය හා දේශපාලනික ක්ෂේත්‍ර ඔස්සේ උපදේශණ සේවා ලබාදෙන පර්යේෂණ ආයතනයකි.